**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2023.05.11 |
|---|---|---|

පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

<u>පොලීසිය තුළ වැඩිහිටියන් සඳහා වූ ඒකකයක් ස්ථාපිත කිරීම සම්බන්ධවයි</u>

ශ්‍රී ලංකාව මේ වන විට ජනගහනය වයස්ගත වෙමින් පවතින බව ප්‍රජාවිද්‍යාඥයින් විසින් පුරෝකථනය කර ඇත. ඒ අනුව 2014 වසර වන විට 12.7% ක් වූ වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය වසර 2050 වන විට 25.7% ක් දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

වැඩිහිටි අයිතිවාසිකම් සම්බන්ධයෙන් 2000 වසරේ ඇති කරන ලද පනත සහ 2011 වසරේ දී එම පනතට සිදුකරන ලද සංශෝධන මඟින් ශ්‍රී ලංකාව තැළ වැඩිහිටියන්ගේ හිමිකම් සම්බන්ධයෙන් නෛතික පිළිගැනීමක් ලබාදී ඇත. නමුත් විවිධ වූ සමාජ, ආර්ථික කරුණු සහ අභ්‍යන්තර සහ බාහිර සංක්‍රමණ හේතුකොට ගෙන ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීමේ ප්‍රවනතාවයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ. එහිදී ගෘහස්ථව ජීවත්වන වැඩිහිටියන් මෙන්ම ආයතනගත වැඩිහිටියන්ද මෙම ගැටළුවලට මුහුණදෙමින් ඇත. ඒ අනුව එම කණ්ඩායම් වල හිමිකම් සුරක්ෂිත කිරීමේදී පොලීසිය මඟින් සුවිශේෂී කාර්යයන් මේවන විටත් ඉටුකරමින් සිටින බව කොමිෂන් සභාව හඳුනාගෙන ඇත.

එම කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව තුළ වැඩිහිටියන් වෙනුවෙන් වෙන් වූ ඒකකයක් ස්ථාපිත කරන්නේ නම් එම කටයුතු වඩාත් කඩිනම් සහ වඩාත් ඵලදායී ලෙස ඉටුකිරීම හැකි බව කොමිෂන් සභාවේ විශ්වාසය වේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ කටයුතු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

විනිසුරු රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com